**කොලොන්නාව නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

------------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කොලොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රවර්ථන වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාලව ගෙවිය යුතු කසළ බැහැර කිරීමේ ගාස්තු පිළිවෙලින් රු.31,126,530 ක් හා රු.29,470,256 ක් ගිණුම්ගත කර නොතිබුණි. | කාල පරිච්ජේදයට අදාල ගෙවිය යුතු වියදම් ගිණුම්වල දැක්විය යුතුවේ. | පසුගිය වර්ෂයේ සිට මුතුරාජවෙල කෙරවලපිටිය කසල අංගනයට ගෙවිය යුතු විශාල හිඟ මුදලක් ඇති අතර එම හිඟ මුදල ගිණුම් තැබීමටද සභාවේ ආදායමක් නොමැත. එබැවින් එම බිල්පත් ගාස්තු සම්බන්ධයෙන් අමාත්‍යාංශ සමග සාකච්ඡා පවත්වන අතර ඒ පිළිබඳ තීරණයක් ලැබෙනු ඇත. |
| (ii) | ප්‍රවර්ථන වර්ෂයේදී 2016 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.50,000,000ක මුද්දර ගාස්තුව අධිකතා ඌනතා ගිණුමට බැර කරනු වෙනුවට පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි. | පෙර වර්ෂ වෙනුවෙන් 2018 වර්ෂයේදී ලද අදායම් අධිකතා ඌනතා ගිණුමට බැර කළ යුතුවේ. | 2016 වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී වැඩිපුර ලද මුදල රු.ලක්ෂ 500 වර්ෂයේ අවිනිශ්චිත ආදායමක් ලෙස සලකා 2018 වර්ෂයේ ආදායම් ශීර්ෂයට බැර කර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පරිපූරකයක් මඟින් ප්‍රාග්ධන වැය ශීර්ෂයකට මාරුකරන ලදි. නමුත් 2018 වර්ෂයේදී ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් නොතිබූ බැවින් එම මුදල ආදායම් ශීර්ෂය හර කර තැන්පත් ගිණුමට බැර කරන ලදි. එසේ කරන ලද්දේ 2019 වර්ෂයේ ඉහත ව්‍යාපෘතිය සඳහා මෙම මුදල යෙදවීමට අවශ්‍ය වන බැවිනි. |

| | | |
|---|---|---|
| (iii) ප්‍රවර්ථන වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ජල ගාස්තුව පිළිවෙලින් රු.2,568,180ක් හා රු.44,062,878 ක් ගිණුම්ගතකර නොතිබුණි. | සියළු ගෙවිය යුතු වියදම් ගිණුම් වල දැක්විය යුතුවේ. | නගර සභා ආඥා පනතේ 133 වගන්තියෙහි ප්‍රතිපාදන යටතේ සභා බල ප්‍රදේශයේ පොදු ජල කණු නාන කාමර සඳහා බිල්පත් පියවීම සභා අනුමැතිය මත සිදු කරනු ලැබේ. ඉතා විශාල සංඛ්‍යාවක් පැවතියත් මේ වන විට ඒවා සීමා කර ඇති අතර දැනට ඇත්තේ 17ක් පමණි. මේවා සම්බන්ධයෙන් ද නිරන්තරයෙන් අධීක්ෂණයක් සිදු කරන අතර මේවා විසන්ධි කිරීම පිළිබඳව සභාව එකඟ නොවන බවද දන්වමි. |
| (iv) සභාව සතුව භෞතිකව නොපැවති රු.18,730,764 ක් වූ මෝටර් රථ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව තිබුණි. | මෙම වත්කම් සම්බන්ධයෙන් සොයාබලා නිවැරදි කළ යුතුවේ. | මෙම වාහන භෞතිකව පවතින අතර නගර සභාව සතු සියලුම වාහන තක්සේරු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ගිණුම නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (v) අංක 194100173792765 දරණ බැංකු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.190,920 ක් වුවද, ශේෂ පත්‍රයේ එම වටිනාකම රු.52,133 ක් ලෙස දක්වා තිබුණි. | වර්ෂය අවසාන දිනට පැවති මුදල් ශේෂය ගිණුම් වල දැක්විය යුතුවේ. | 2005 වසරේ සිට 2008 තෙක් මෙම ගිණුමේ බැංකු සැසඳුම් සාදා නොමැති බැවින් ගිණුමේ සැසඳීම් සිදු නොවීම නිසා යාවත්කාලීනව ගිණුම පවත්වාගෙන ගොස් නොතිබුනි. දැනට බැංකු සැසඳුම් සකස් කර ඇතත් මුදල් පොත අනුව ශේෂය හා මුදල් ගිණුමේ ශේෂය අතරද බැංකු ශේෂය අතර ද වෙනස්කම් පවතී.<br>ඉදිරියේදී හැකිතාක් දුරට ගිණුමේ ශේෂය නිවැරදි කිරීමටත් කටයුතු කරමි. |
| (vi) වරිපනම් ගිණුමේ වැරදි, නිවැරදි කිරීම සඳහා වරිපනම් පාලන ගිණුමට බැර කරන ලද රු.440,546ක් වරිපනම් ආදායමින් අඩු කිරීම වෙනුවට, මුදල් ආධාර හා සහනාධාර ගිණුමට හරකර තිබුණි. | සියළු වියදම් නිවැරදිව ගිණුම්ගතකළ යුතුවේ. | පිළිගනිමි.<br>ඉදිරියේදී නිවැරදි කිරීමටත් මින් පසු මෙවැනි දෝෂ ඇති නොවීමටත් උපදෙස් දෙන ලදි. |
| (vii) ප්‍රවර්ථන වර්ෂයේ අළුතින් එකතු වූ වරිපනම් ගාස්තු රු.2,234,598ක් වරිපනම් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම් ගිණුමට බැරකර තිබුණි. | සියළු ආදායම් නිවැරදිව ගිණුම්ගතකළ යුතුවේ. | පිළිගනිමි.<br>ඉදිරියේදී නිවැරදි කිරීමටත් මින් පසු මෙවැනි දෝෂ ඇති නොවීමටත් උපදෙස් දෙන ලදි. |

| | | |
|---|---|---|
| (viii) මූල්‍ය ප්‍රකාශන අනුව පොදු ගබඩා ගිණුමේ ශේෂය රු.47,431,690 ක් වුවද, 2018 දෙසැම්බර් 31 දිනට ගබඩා ලේඛන අනුව ශේෂය රු.12,000,790 ක් වීම නිසා වත්කම් රු.35,430,900 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොග අගය දැක්විය යුතුවේ. | පොදු ගබඩා ගිණුම හා වාර්ෂික තොග උපලේඛන ශේෂය අතර පවතින වෙනස වසර කිහිපයක සිට පවතින බැවින් එකී වෙනස්වීම් නිවැරදි කිරීම සඳහා 2019.03.12 වන දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාවට අනුව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අතැති තොගය හා තොග ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ආ) නොසැසඳුනු ගිණුම්

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ගිණුම් විෂයන් 03ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ ඒවාට අදාල උපලේඛනවල ශේෂ අතර රු.14,177,942ක වෙනසක් පැවතුණි. | ගිණුම් ශේෂ හා උපලේඛනවල ශේෂ සැසඳීම කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී උපලේඛනය හා ගිණුමෙහි ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන ගිණුම් විෂයන් 04කට අදාල එකතුව රු.998,410 ක් වූ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නෛතිකව අයකර ගත නොහැකි හිඟ ආදායම් කපා හැරීම සඳහා කරුණු ඉදිරිපත් කර පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද පසු ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. වැඩිපුර ලද දේපල ණය පොළී මුදල් අදාල කාලසීමාව නිර්ණය කර පියවීමට කටයුතු කරමින් පවතී.ලැබිය යුතු රක්ෂණ වන්දි මුදල ගිණුමෙන් ඉවත්කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වටිනාකම රු.25,489,777 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය / සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි.<br>2019 වර්ෂයේ නව ගිණුම් ක්‍රමයට අදාලව සියලු ස්ථාවර වත්කම් තක්සේරුව සිදු කළ යුතු අතර එම තක්සේරුව සිදු කිරීමෙන් පසු ලබා ගන්නා ශේෂය අනුව ඉදිරියේදී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම.

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හාකළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥා පනතේ<br>(i) 33 වගන්තිය | සභාවට අයත් දේපළ 15ක් සම්බන්ධයෙන් අයිතිවාසිකම, හිමිකම නගර සභාව සතු කිරීම සඳහා ප්‍රමාණවත් පැවරුමක් සහතිකයක් හෝ වෙනත් ලියවිල්ලක් සභාව සතුව නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේ දී සභාවේ සියළුම දේපල සඳහාද හිමිකම් ඔප්පු හා මිනින්දෝරු සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) 33 (2) වගන්තිය | නගර සභාවක් සතු කරනු ලැබ ඇති සියළු නිශ්චල දේපළ පරිපාලනය කර ඉන් ලැබෙන ආදායම නගර සභා ආඥා පනතේ කාර්යයන් සඳහා යෙදවීමට හා ප්‍රයෝජනයට ගතයුතු වුවත් සභාවට අයත් දේපළ 11ක් හඳුනාගෙන පරිපාලනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |
| (iii) 133 වගන්තිය | සභා බලප්‍රදේශයේ පොදු ජල සම්පාදන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබියදී හා පදිංචිකරුවන්ගෙන් ජල ගාස්තුවක් අය කර නොතිබියදී පොදු ජල කණු වෙනුවෙන් ජාතික ජලසම්පාදන මණ්ඩලයට මාසිකව රු.214,015 බැගින් වසරකට රු.2,568,180 ක වියදමක් දරා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයේ පොදු ජල කණු නාන කාමර සඳහා බිල්පත් පියවීම සභා අනුමැතිය මත සිදු කරනු ලැබේ. දැනට ඇත්තේ 17 ක් පමණි. මේවා විසන්ධි කිරීම පිළිබඳව සභාව එකඟ නොවන බවද දන්වමි. |
| (ආ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | සභා බලප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු නොකර වසර 07 කට පෙර ලබා ගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | තක්සේරු ප්‍රතිශෝධනය මෙම වසරේ සිදු කිරීමට නියමිත අතර තක්සේරුවේ ප්‍රමාදය මග හරවා ගැනීම සඳහා 2017 වර්ෂයේ තක්සේරු වටිනාකම - නේවාසික 6% - 8% දක්වා ද ව්‍යාපාරික 18% |

| | | | |
|---|---|---|---|
| | | | - 20% දක්වා ද ප්‍රතිශතය ප්‍රතිශෝධනය කර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 104 (1) හා 104 (2) | කෘෂ කැබ් රථය 2017 ජුලි 28-31 අතර කාලය තුල අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් අදාල කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිතුරු සපයා නැත. |
| (ii)මු.රෙ 371 (5) | දිගින් දිගටම පැවත එන රු.68,000ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | රු. 25,000ක අත්තිකාරම් මුදල 2019.02.08. වන දින ලදුපත් අංක 04604 මඟින් පියවන ලදී. 2018 වසරේ හදිසි අනතුරු වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීමට ලබාගත් රු. 20,000 ක අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.. |
| (iii) මු.රෙ 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු හඳුනාගෙන/විමසීම්කර ආදායමට ගතයුතු වුවත්, එකතුව රු.250,000වූ වර්ෂ 02ක ඉක්ම වූ තැන්පතු 04ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. මංගලපාය තැන්පතු සහ මාර්ග අලාභහානි සඳහා වූ තැන්පතු මුදල් සම්බන්ධයෙන් , පුවත්පත් දැනුම් දීමකින් අනතුරුව ආදායමට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමි. ආදායම් වෙනුවෙන් තැන්පත් සම්බන්ධයෙන් පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. ආදායමට ගත යුතු තැන්පතු අනුමැතියකට යටත්ව ආදායමට ගැනීම සඳහාද අවශ්‍ය කටයුතු කරමි. |
| (ඇ) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | කඩකුලී තක්සේරුව වසර 3කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයවේ. | මූලික නීතියෙහි සඳහන් කරනුයේ පස් වසරකට වරක් කුලිය සංශෝධනය විය යුතු යන්නය. දැනට පවත්නා තක්සේරුව ක්‍රියාත්මක වන්නේ 2014 වර්ෂයේ සිටය.2019 වසරේ එම තක්සේරුව අවසන් වන බැවින් 2020 සිට නව තක්සේරුවක් සිදු කිරීමට නියමිතය. |
| (ඉ) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝණ අපද්‍රව්‍ය | පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා, සභාව විසින් බලප්‍රදේශයේ පැවති නිවාස හා | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ | කසළ සඳහා බද්දක් අය කිරීමට සභාව අකමැති විය. කසළ ලෝඩ් 01ක් (ට්‍රැක්ටර් ට්‍රේලරයක්) සඳහා සියළුම බදු |

| | | |
|---|---|---|
| කළමනාකරණ රීති 18 (I) | ව්‍යාපාරික ආයතන 1060 කින් කසළ බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. යුතුවේ. | සමග රු. 10,000 ක මුදලක් ව්‍යාපාරික ප්‍රජාවගෙන් අය කිරීමට යෝජනාව 2018 අගෝස්තු මස මහ සභාවේදී සභා සම්මත විය. ඒ අනුව 2018 ඔක්තෝම්බර් සියළුම වෙළඳ ප්‍රජාව ලිඛිතව දැනුවත් කර 2018 නොවැම්බර් මස සිට එකී මුදල අය කෙරුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.36,798,316 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.55,310,981 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ජංගම ගිණුම් අංක 194100153792766 (කොලොන්නාව මහජන බැංකුව) | | |
| 1993 වර්ෂයේ සිට පැවත එන රු.15,000 ක මුදල් මාරු කිරීම් හා නිශ්චිතව කාලයක් සොයා ගත නොහැකි උපලබ්ධි නොවූ රු.10,104 ක් වු චෙක්පත් බැංකු ප්‍රකාශනයේ ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා තිබුණි. | නිරවුල් කරගැනීමට පියවර ගතයුතුවේ. | 1980 ඔක්තෝබර් 17 දිනැති අංක බ/31 462934 යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලද රු.10,104 ක්වූ චෙක්පත උපලබ්ධි නොවී බැංකු සැසඳුම්වල මේවන තෙක් සටහන් වී ඇත.<br>2019.05.15 දින සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ලිපියක් යොමු කර ඇති අතර ලැබෙන උපදෙස් මත ඉදිරියේ දී කටයුතු කරමි.<br>පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන රු.15,000 ක මුදල ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) ජංගම ගිණුම් අංක 194100173792765 (කොලොන්නාව මහජන බැංකුව) | | |
| වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති (බැංකු දෝෂ, මුදල් මාරු කිරීම්) රු.172,721ක් බැංකු ශේෂයට එකතුකර බැංකු සැසඳුම් ප්‍රකාශ සකස්කර තිබුණු අතර රු.70,237ක් එම ශේෂයෙන් අඩුකර තිබුණි. ඉහත ගැලපීම් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිගත හැකි තත්ත්වයක නොපැවතුණි. | නිරවුල් කරගැනීමට පියවර ගතයුතුවේ. | මුදල් මාරු කිරීම් හඳුනා ගත් 89,921 ක වටිනාකම හා මුදල් මාරු කිරීම් යටතේ අඩු කිරීම් ලෙස දක්වා තිබූ 70,237 න් 69,405 ක වැඩිපුර තැන්පත් ලෙස සඳහන් මුදල මේ වන විට නිරවුල් කර ඇත. රු 400ක වැඩිපුර තැන්පත් ලෙස සඳහන් මුදල මේ වන විට නිරවුල් කර ඇත. අනෙකුත් අයිතම හැකිතාක් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 75,000,000 | 80,095,023 | 76,544,002 | 30,471,237 | 74,620,000 | 83,379,116 | 75,566,342 | 43,887,616 |
| (ii) කුලී | 4,499,670 | 15,437,540 | 15,238,566 | 3,370,102 | 13,543,760 | 7,428,269 | 8,179,133 | 3,128,043 |
| (iii) බලපත්‍ර ගාස්තු | 300,000 | 1,499,515 | 1,499,515 | 43,450 | 850,150 | 462,250 | 462,250 | 43,450 |
| (iv) වෙනත් ආදායම් | 16,740,191 | - | 16,740,191 | - | 10,984,500 | - | 21,036,951 | - |
| එකතුව | 96,539,861 | 97,032,078 | 110,022,274 | 33,884,789 | 99,998,410 | 91,269,635 | 105,244,676 | 47,059,109 |

### 2.3.2 වරිපනම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ හිඟ වරිපනම්, ප්‍රවර්ථන වර්ෂයේ වරිපනම් බිල් කිරීම හා දඩ ගාස්තු ඇතුළුව අයවිය යුතු රු.123,982,639 කින් වර්ෂය තුල රු.76,544,002 ක් අයකර ගෙන තිබුණු අතර අයවිය යුතු ශේෂය මුළු වරිපනම් බිල් කිරීම්වලින් සියයට 38 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගතයුතුවේ. | 2019 ජූනි මස සිට දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර හිඟ වරිපනම් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ) හිඟහිටි ශේෂය රු.50,000 ඉක්මවූ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දේපළ 56 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.14,425,756 ක් විය. මෙම හිඟය එදිනට පැවති මුළු හිඟයෙන් සියයට 47ක් විය. සභාව විසින් මෙම හිඟ වරිපනම් ආදායම අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගතයුතුවේ. | හිඟ වරිපනම් පවතින ස්ථානයන්ගෙන් අවසාන නිවේදන නිකුත් කිරීමෙන් අනතුරුව රු.4,716,206ක් (එය ප්‍රතිශතයක් වශයෙන් 48% කි.) අය කර ගෙන ඇත. දේපල තහනම් කිරීම් මඟින් බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 නිවාස කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිවාස 15කින්, රු.231,250ක කුලී ආදායමක් ලැබී තිබුණු අතර 2018 නොවැම්බර් 30 දිනට තවදුරටත් | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගතයුතුවේ. | මේ වන විට පවතින හිඟ කුලියෙන් රු.112,580 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟය අය කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ හිඟ කුලී රු.726,220ක් විය. | | |
| (ආ) වැල්ලම්පිටිය නව නිවාස සංකීර්ණයේ පිහිටි නිවාස 08 න් 2018 වර්ෂය තුලදී අයවිය යුතු හිඟ කුලී හා ප්‍රවර්ථන කුලී වලින් කිසිදු මුදලක් නොගෙවීම නිසා නිවාස 02 කින් 2018 නොවැම්බර් 30 දිනට අයවිය යුතුව තිබූ මුළු හිඟ මුදල රු.254,400ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගතයුතුවේ. | මේ වන විට පවතින හිඟ කුලියෙන් රු.70,580ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟය හා ප්‍රවර්තන අය කිරිමට කටයුතු කරමි. |
| (ඇ) ප්‍රවර්ථන වර්ෂයට අදාල කුලී මුදල් සම්පූර්ණයෙන්ම නොගෙවූ සහ හිඟ කුලීවලින් කොටසක් පමණක් ගෙවූ නිවාස 02කින් 2018 නොවැම්බර් 30 දිනට සභාවට අයවිය යුතු මුළු මුදල රු.168,420ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගතයුතුවේ. | මේ වන විට පවතින හිඟ කුලියෙන් රු.20,000 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟය හා ප්‍රවර්තන අය කිරිමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යය සාධනය
----------------------

නගර සභා ආඥා පනතේ (4) වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්
--------------------------------

| විගණන නිරීක්ෂණය | වටිනාකම රු. | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් තුලදී ඇස්තමේන්තු වටිනාකම රු.1,610,146ක් වූ කර්තව්‍යයන් 04 ක් ආරම්භ නොකර අත්හැර දමා තිබුණි. | 768,432 | සැලසුම් කළ කර්මාන්ත අවසන් කළ යුතුවේ. | මහජන විරෝධතා මත මෙම කර්මාන්තය අත්හිටුවා ඇත. |

(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වටිනාකම රු.1,102,143 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 03ක් සම්බන්ධයෙන් ඉටුකිරීමේ ප්‍රමාදයන් පැවතුණි. | නිවැරදිව සැලසුම් කර ගත යුතුවේ. | මෙම කර්මාන්තවල වැඩ ආරම්භ කිරීමට ප්‍රමාදවූයේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමට ප්‍රමාදවීම නිසාවෙනි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (i) පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/03/2017 දරණ චක්‍රලේඛය ප්‍රකාරව එකතු කරනු ලබන සියළුම කසළ 100% ක් වෙන්කර භාර ගැනීම අනිවාර්ය වුවත් 2018 වර්ෂයේදී සභාව විසින් මුතුරාජවෙල කසළ අංගනයට ටොන් 7875 ක් බැහැර කර තිබුණු අතර එයින් ටොන් 3957 ක් මිශ්‍ර කසළ විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | කොළොන්නාව නගර සභාව 2019 වර්ෂය වන විට කසළ වෙන්කර ලබා ගැනීමට අනුගත වී ඇත. ඒ බව මුතුරාජවෙලින් එවන ලද කසළ සම්බන්ධව වාර්තා වලින් තහවුරුවේ. |
| (ii) නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 18 (1) ඡේදය අනුව සභා බලප්‍රදේශයේ පිහිටි නිවාසවලින් කසළ ගාස්තුවක් අයකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතුවේ. | කසළ ලබා ගැනීම වෙනුවෙන් වෙනම මුදලක්, එනම් කසළ බද්දක් අය කිරීමට නගර සභාවේ මහ සභාව එකග නොවේ. මහ සභාවේ සමාජිකයින් පවසනුයේ අඩු ආදායම්ලාභී ප්‍රජාවක් වෙසෙන අපහට එය ක්‍රියාත්මක කල නොහැකි බවයි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | 2030 න්‍යාය පත්‍රයට අනුව කටයුතුකල යුතුවේ. | 2019.01.31 වන දින පළාත් පාලන ආයතන වල සැලසුම් සඳහා තිරසර සංවර්ධන ඉලක්ක අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන පවත්වන ලදි.එම නිසා තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව සභාවට ක්‍රියාත්මක වීමට හැකිවූයේ 2019 වසරේ සිටය. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>සභාවේ ලේකම් තනතුර සඳහා පරිපාලන සේවයේ III/II තනතුරක් අනුමත වී තිබුණද මේ දක්වා වෙනත් සේවාවන් වලට අයත් නිලධාරීන් එම තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර තිබුණි. ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී තනතුරු පුරප්පාඩුව පැවතුණි. | ඉහල කළමණාකරණ තනතුරු දෙක අදාල සේවාවන්ගෙන් අප්‍රමාදව පුරවා ගත යුතුවේ. | 2019.03.31 දිනට ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී තනතුරු වල පුරප්පාඩු සෑම කාර්තු වාර්තා හා වෙනත් විශේෂ අවස්ථා මඟින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත. |
| (ආ) සේවක ණය<br>2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 26 දෙනෙකුගෙන් රු.2,432,744 ක් ද සේවය හැර ගිය හා මියගිය නිලධාරින් 57 දෙනෙකුගෙන් රු.2,139,407 ක් ද ඇතුළුව රු.56,270,376 ක් අයවිය යුතුව තිබුණි. | අයවිය යුතු සේවක ණය අයකර ගැනීමට නොපමාව කටයුතු කල යුතුවේ. | සේවය හැර ගිය හා මියගිය නිලධාරීන් 11 ගෙන් සම්පූර්ණ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර ඇති අතර සේවය හැර ගොස් ඇති නිලධාරීන් 09 දෙනෙකුට අදාල ඇපකරුවන්ගෙන් ණය මුදල වාරික වශයෙන් මාසිකව අය කරගනු ලැබේ.ඉතිරි ණය ශේෂය ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සභාවට හිමිකාරීත්වය ඇති ප්‍රමාණය අක්කර 04 රූඩ් 01 පර්චස් 25.92 ක් වූ ඉඩම් කට්ටි 11ක් සඳහා හිමිකම් ඔප්පු පැවතියද භෞතිකව හඳුනාගෙන පිඹුරු සකස්කර ඒවා ආරක්ෂා කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉඩම් ආරක්ෂා කිරීමට පියවර ගත යුතුවේ. | මෙම දේපළ අතීතයේදී සභාව වෙත හිමිකාරීත්වය පැවතියත් මේ වන විට ස්ථාවර වත්කම් ලේඛන වල ඇතුලත් නොවේ. වර්ෂ ගණනාවකට පෙර මෙම දේපල විවිධ රජයන් යටතේ විවිධ කාර්යයන් සඳහා යොදාගෙන ඇති අතර සභාව වෙත හිමිකාරීත්වය නොමැති මෙම දේපල පරිපාලන කටයුතු සිදු කිරීමක් අවශ්‍ය නොවේ. |

3.3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වටිනාකම රු.3,706,365ක් වූ වාහන 02 ක් වර්ෂ ගණනාවක සිට ඌන උපයෝජිතව පැවතුණි. | සියළු වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කලයුතුවේ. | කම්පැක්ටරය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් ට්‍රැක්ටරය බොහෝ පැරණි බැවින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) අභිනවයෙන් පත්වූ සභාව සඳහා මේස, පුටු මිලදී ගැනීමේදී අඩුම ලංසුව ඉදිරිපත් කරතිබූ සැපයුම්කරුගෙන් මිලදී නොගෙන දෙවන අඩුමිල සඳහන් ලංසුව පිළිගෙන භාණ්ඩ මිලදී ගැනීම නිසා සභාවට රු.281,361ක පාඩුවක් සිදු වී තිබුණි. | වගකිව යුත්තන්ගෙන් අයකර ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ)සභාවේ විදුලි භාණ්ඩ මිලදී ගැනීමේදී වොට් 125 ඔස්රම් මර්කරි බල්බ් 600 ක් මිලදී ගැනීම වෙනුවෙන් අඩුමිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් මිලදී නොගෙන දෙවන අඩුමිල සඳහන් සැපයුම්කරුගෙන් මිලදී ගැනීම නිසා සභාවට රු.84,000 ක් පාඩු සිදු වී තිබුණි. | වගකිව යුත්තන්ගෙන් අයකර ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නැත. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්ම 2018 පිළියෙල කරීමේදී හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳව මනා අවබෝධයක් නොමැති වූ නිසා නොදැනුවත්කම මත සිදුවූ ප්‍රමාද දෝෂය මත අඩුපාඩු සිදුවිය. 2019 වසරේදී විගණන උපදෙස් ලබාගෙන අදාල අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |
| (ආ)ඉඩම් වැඩිදියුණු කිරීම, ආදාහනාගාර සංවර්ධනය සහ මාර්ග අළුත්වැඩියාව සහ කාණු ඉදිකිරීම වෙනුවෙන් අයවැය ලේඛනයෙන් රු.14,500,000ක් ප්‍රතිපාදනය කර තිබුණද 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉහත පිළිතුර අදාල වේ. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | පිළිගනිමි. 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කර නොමැති අතර 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන 6 ක් සිදුකර ඇති අතර ඉන් 3 ක පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |